3 වන පිටෙන්

බැසිල් කියන විට ඒ ප්‍රකාශ පිළිගෙන හිමිකරුවකු නැති දේපල ලෙස වෙන්දේසි කිරීම ද බරපතල සැකයක් ජනිත කරවයි. ඉඩමක ලියාපදිංචි හිමිකරුවා සෙවීම මේ තරම් අමාරුද? එ සේ ම වත්මන් ආණ්ඩුවේ ඇමතිවරුන්ට ශ්‍රී ලංකා - යූ ඇන් පී දෙගොල්ලටම) විරුද්ධව ඉදිරිපත් වී ඇති චෝදනා ගැන පරීක්ෂණ ඇල්මැරෙන්නේ ඇයි?

මේ අයුරින් ජනාධිපතිවරයාගේ කතාවට පසුබිම් වූයේ යයි එකිනෙකාට සිතෙන කරුණු ගොඩගැසිය හැකිය. එහෙත් ඒ කිසිවක් ගැන ඉඟියක් හෝ එතුමාගේ කතාවෙන් ලැබුණේ නැත. එතුමාගේ කතාවෙන් දැඩි ලෙස අවධාරණය වූයේ යුද්ධය කළ හමුදා නිලධාරීන් උසාවි ගෙනයාම (එතුමා පාවිච්චි කළේ දක්කාගෙන යාම යනුවෙනි) සහ හමුදා බුද්ධි අංශ සාමාජිකයන් අත්අඩංගුවට ගෙන දිගින් දිගට රිමාන්ඩ් බාරයේ තබාගැනීම හෙළාදකින බවයි.

ජනාධිපති කතාවේ නිශ්චිතව සඳහන් වූ සිදුවීම් දෙක ලොකු පඩි ලබමින් ඇවන්ගාඩ් සමාගමේ රස්සාව කළ විශ්‍රාමික නාවුක හමුදාපතිවරු තිදෙනෙක් හිටපු ආරක්ෂක ලේකම්වරයා සමග උසාවියට කැඳවීම සහ පැහැරගෙන ගොස් ඝාතනය කෙරුණු බව ඔප්පුවෙමින් පවතින ප්‍රගීත් එක්නැලිගොඩ නඩුවට අදාලව රිමාන්ඩ් භාරයේ සිටින හමුදා බුද්ධි අංශ නිලධාරීන්ට ඇප නොදීමයි.

තමා යුද්ධය කළ රණවිරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටින බව එතුමා අවධාරණය කළේය. එසේ අවධාරණය කෙරෙන අවස්ථාවේදී එතුමාගේ සුපුරුදු සන්සුන් ඉරියව් වෙනස් වූවා පමණක් නොව විධායක ජනාධිපතිකම ඇඟට ගත් බවක් ද ප්‍රදර්ශනය විය.

එතුමාගේ ප්‍රකාශය සාධාරණය කිරීමට කරුණු ගොනුකරන සමහරු කියන පරිදි මේ ප්‍රකාශය කෙරෙන අවස්ථාවේ එතුමා කිසියම් ආතතියක සිටියේ නම් අපට නම් පෙනෙන්නේ එම තත්වය පසුගිය එක් අවුරුදු දසමසක කාලය තුළ එතුමා විසින්ම නිර්මාණය කර ගත්තක් බවය. එතුමා ජනාධිපති තනතුරට පත්වී දින කිහිපයක් ඇතුළත එනම් 2015 ජනවාරි 16 වෙනිදා මේ ලියුම්කරු මෙසේ පෙරදැක්කේය.

''...... සියල්ල වැරදී පරාජය බාරගන්නට බලකෙරුණු විට ඔහු සහ ඔහුගේ හෙන්චයියන් කළේ කුමක්ද? මෛත්‍රී දිනුවේ ඊළාම් ඡන්දවලින් යයි කියමින් වසර දහයක් තම බලය වෙනුවෙන් යොදාගත් ජාතිවාදය ම ඇවිස්සීමයි. රාජපක්ෂලා නැති තැන තමන්ට යන එන මං නැතිවන බව දන්නා විමල් වීරවංශ සහ ගම්මන්පිළ කළේ මහින්ද කෙළින්කර ඔහුගේ නායකත්වයෙන් මහමැතිවරණයට එන බවට වහසි බස් දෙඩීමයි. අනුර ප්‍රියදර්ශන යාපා සහ නිමල් සිරිපාල ද සිටියේ එතැනයි. ඔවුන් එක්වී අතර පැවති ජනතාද්‍රෝහී පාලනය වෙනත් මුහුණුවරකින් ගෙන යාමටය මේ සැලසුම් කරන්නේ.''

එදා සිට අද දක්වාම ජනාධිපති මෛත්‍රීගේ ප්‍රධාන අරගලය වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ රාජපක්ෂ ආදිපත්‍ය පරාජය කර තම නායකත්වය තහවුරු කර ගැනීම සඳහා වන සටනයි. මේ සඳහා ඔහුට දූෂිතයන්ට ඇමතිකම් සහ වෙනත් තනතුරු පුදන්නට සිදුවිය. මෛත්‍රී ප්‍රතිරූපය පළුදුවීම ඇරඹෙන්නේ එතැනිනි. මහින්ද අතහැර තමා වෙත ආවා යැයි සිතූ අය කළේ තීරණාත්මක අවස්ථාවල මහින්ද කෙළින් කරන්නට අවශ්‍ය පියවර ගැනීමයි. දෙන්නේ නැතැයි හත්පොලේ දිවුරුවත් මහින්දට

**කැළල සිදුවී හමාරය. දැන් එය සෝදා ගන්නට නම් අපරාධ සහ දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ආයතන ශක්තිමත් කර සියලු පරීක්ෂණ නිවැරදිව කාර්යක්ෂමව කෙරෙන බවට වග බලා ගත යුතු වෙයි. වැරදිකරුවන් රාජපක්ෂලාද හමුදාවල අයද, හිටපු ඇමතිවරුද දැන් සිටින ඇමතිවරුද යන්න නොසලකා තරාතිරම නොබලා දඬුවම් ලැබෙන ලෙස වගබලා ගත යුතු වෙයි.**

මහින්ද රාජපක්ෂ මැදමුලනින් කොළඹට ගෙනවුත් පුවත්පත් සාකච්ඡා පවත්වන විට වාසුදේව තිස්ස විතාරණ ඒ පිළිකන්නේ සිටිනු දකින්නට ලැබිණි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයිතිය වෙනුවෙන් ඔවුන් ඔළුගෙඩි ගණන් කර පෙන්වූහ.

ඒ උත්සාහයන්ද වැරදී ගිය තැන දැන් මහින්ද මහා දනපතියෙකුගේ වෙස් ගන්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වය මෛත්‍රීට පූජා කරන්නට පෙරහර සකස් කරගෙන එයි. තව සතියක් යන විට කිසිවක් ඉතිරි නොවන බව දන්නා පිරිස පෙරහරේ කසකාරයයන් වී සිටිති. බඩපිණුම්කාරයෝද බම්මන්නෝද තම තමන්ගේ ශිල්ප දක්වන්නට තරග වැදී සිටිති.

බැලූ බැල්මට හාස්‍ය රංගනයක් ලෙස පෙනුනද මෙය මර උගුලකි. පක්ෂ නායකත්වය මෛත්‍රීට පවරා පක්ෂයේ දියවීම වළක්වා ගෙන පාර්ලිමේන්තුවේ බහුතරය රැකගෙන අවස්ථාව බලා රනිල් අගමැතිකමින් නෙරපා එතැනට රාජපක්ෂ හෝ ඔහුගේ අන්තේවාසිකයකු පත්කර ගැනීම මොවුන්ගේ උපායයි. ඒ මගින් මෛත්‍රී පාලනය බිඳ දමා හෝ දුර්වලකර දූෂිතයන් රැකගැනීම ප්‍රධාන අපේක්ෂාව වන මහමැතිවරණයට නාම යෝජනා දෙන්නට මෛත්‍රීට සිදු වන්නේ ඔවුන්ගේ බලපෑමට යටවීමෙනි. අනාගතයේ මහින්දගේ අගමැතිකම සහිත ඒකාබද්ධ විපක්ෂයේ ආණ්ඩුවක් හැදීම ගැන බලාපොරොත්තුවක් මැවීමට ශක්තිය ලැබෙන්නේ ජනාධිපතිවරයා රටට පෙන්වා ඇති පරිදි තම කැමැත්තට පිටින් ගන්නා ලද ඒ නාමයෝජනා තීන්දුවෙනි. පාර්ලිමේන්තුව තුළ ඔළුගෙඩි වෙනස් කිරීමෙන් ආණ්ඩු හැදීමක් ගැන කතා කරන්නට මහින්දට අවස්ථාව ලැබෙන්නේ ඔහුට පාර්ලිමේන්තුවට එන්නට මග පෑදූ නාමයෝජනා තීන්දුව නිසාය. එවැනි කතා ඇසෙන විට රාජපක්ෂ කාලයේ සිදුවූ දූෂණ සහ අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන නිලධාරීන්ට දෙවරක් හිතා බලන්නට සිදු නොවන්නේද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් බහුතරයක් සහ බහුතර සාමාජිකයන් ද අනුගාමිකයන් ද අදත් සිටින්නේ ඒ බලාපොරොත්තුව මතය.

ඒ බලාපොරොත්තුව මත ශක්තිය ලබා ඔවුන් ජාතිවාදය අවුස්සන විට රට පාවා දෙන්නට යන්නේ යයි චෝදනා නගන විට රටේ දහසක් ප්‍රශ්න තිබියදී ජනාධිපතිවරයාට සිදුවී ඇත්තේ ඔවුන්ට පිළිතුරු දෙන්නට තම ශක්තියත් කාලයත් යෙදවීමටය. හදන්නට යන ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට ඇති තැන නැති කරන්නට යන්නේ යයි මහින්දවාදීන් චෝදනා කරන විට බෞද්ධ භික්ෂූන් ඉදිරියේ දහසක් පොරොන්දු දෙන්නට ඔහුට සිදුවෙයි. 'රට බේරාගත් රණවිරුවන්' පාවා දෙන්නට යන්නේ යයි මහින්ද කියන විට ඊට පිළිතුරු හැටියට හමුදාව වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටින බව කියන්නට මෛත්‍රීට සිදුවෙයි. ඒ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් හැදීමක් ගැන කතා කරන්නට ද සිදුවෙයි. දැනටත් ග්‍රන්ථ ගතවී ඇති පරිදි ගෝඨාභයලා සමග රහස් සාකච්ඡාවලට යන්නට ද සිදුවෙයි.

ජනාධිපතිතුමා උක්ත කතාවට සතියකට පෙර විශ්‍රාමික හමුදා නිලධාරීන් පිරිසකට ආණ්ඩුවට සම්බන්ධ ආයතනවල රැකියා සඳහා පත්වීම් ලබා දුන්නේය. ඒ අවස්ථාවේ කළ කතාවේදී එතුමා කී දේවල්ද මෙහිදී අපේ සැලකිල්ලට භාජනය වන්නේය. තරුණ තරුණියන් රැකියා විරහිතව සිටිද්දී මෙසේ විශ්‍රාමික පිරිසකට තවත් රක්ෂා දීම ගැන තමාට විවේචන එල්ලවිය හැකි බවත් එහෙත් ඒ තරුණ තරුණියන්ට නැති පුහුණුවක් සහ අත්දැකීම් හමුදාවේ අයට ඇති බවත් එතුමා කියනු ඇසිණ. මේ කතාව අසා සිටි මට සිතුණේ මේ ක්‍රියාත්මක වන්නේ තවත් ගෝඨාභය ව්‍යපෘතියක් නොවේද යන්නයි. මේ සියල්ල අප මුලදීම පෙරදුටු පරිදි මහින්ද ඇටවූ පක්ෂ උගුලේ පැටලීමේ ප්‍රතිඵල නොවන්නේද?

'අති පූජනීය වන්දනීය මහා සංඝ රත්නය' කියන විට ඒ මහා සංඝරත්නයෙන් බහුතරයක් සිටියේ සහ සිටින්නේ ඉතිහාසයේ සිට අද දක්වාම මේ රට විනාශයට දක්කන ජාතිවාදය සමග බවත් 'රටබේරා ගත් රණවිරුවන්' කොන්දේසි විරහිතව ආරක්ෂා කරන්නට කතා කරන විට පසුගිය කාලයේ සිදුවූ බොහෝ අපරාධවලට සම්බන්ධ බොහෝ දෙනෙක් රණවිරුවන් යයි කියන අය අතර සිටින බවත් සිහියේ තබා ගැනීම අවශ්‍යය. නමුත් පක්ෂ නායකත්වය පිළිබඳ අර්බුදය විසින් ඒ සිහිය අවුල් කරන බවය අපට පෙනෙන්නේ.

කැළල සිදුවී හමාරය. දැන් එය සෝදා ගන්නට නම් අපරාධ සහ දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ආයතන ශක්තිමත් කර සියලු පරීක්ෂණ නිවැරදිව කාර්යක්ෂමව කෙරෙන බවට වග බලා ගත යුතු වෙයි. වැරදිකරුවන් රාජපක්ෂලාද හමුදාවල අයද, හිටපු ඇමතිවරුද දැන් සිටින ඇමතිවරුද යන්න නොසලකා තරාතිරම නොබලා දඬුවම් ලැබෙන ලෙස වගබලා ගත යුතු වෙයි. පක්ෂයේ අවුල විසඳා ගත හැකි මග ද එයයි. එ සේ නොමැතිව හැරුණු වැරදි මග ඉදිරියට ගියහොත් හානිය සිදුවන්නේ යන්තම් හිස ඔසවමින් ආ ප්‍රජාතන්ත්‍රවාදයටයි. අපට වැදගත් වන්නේ එය මිස නායකයකුගේ පෞද්ගලික පැවැත්ම හෝ පක්ෂයක පැවැත්ම නොවේ.

ජයතිලක කම්මැල්ලවීර

## සන්නස Cartoon by PK




සන්නස
මංගල යෝජනා

මුල් වචන 40 සඳහා
මාසයකට අයකිරීම ඩොලර් 30

පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර
එම ලදු පත සමග
ඔබේ දැන්වීම අපට එවන්න

Account Name - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847